# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 34 දරන
# එක්ස්පෝ 80 පදනම (මොරටුව)
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ක නොවැම්බර් මස 07 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 ඔක්තෝබර් මස 07 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය**

**මිළ : ශත 60 යි.**

**තැපැල් ගාස්තුව : ශත 75 යි.**

## 1988 අංක 34 දරන එක්ස්පෝ 80 පදනම (මොරටුව) (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 ඔක්තෝබර් මස 7 වන දින]

එල්. ඩී.—ඕ. 9/88

**එක්ස්පෝ 80 පදනම (මොරටුව) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"එක්ස්පෝ 80 පදනම (මොරටුව)" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1988 අංක 34 දරන එක්ස්පෝ 80 පදනම (මොරටුව) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

'එක්ස්පෝ 80 පදනම (මොරටුව)' සංස්ථාගත කිරීම.

2. මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන එක්ස්පෝ 80 පදනම (මොරටුව) නමැති සංගමයෙහි දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "එක්ස්පෝ 80 පදනම (මොරටුව)" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් වන්නේය. තව ද ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද ඒ නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ කැමති පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මොරටුව මැතිවරණ කොට්ඨාසයේ පදිංචිකරුවන්ගේ හා ඡන්ද හිමියන්ගේ ශුභ සාධනය නංවාලීම ;

(ආ) ඒ ඡන්ද කොට්ඨාසයේ ආර්ථික, සමාජ, දේශපාලන හා සංවර්ධන වැඩ කටයුතුවල නිරතවීම ;

(ඇ) ඒ ඡන්ද කොට්ඨාසයේ අධ්‍යාපනික, ක්‍රීඩා හා විනෝද කටයුතු නංවාලීම ;

(ඈ) ඒ ඡන්ද කොට්ඨාසයේ පදිංචිකරුවන්ගේ හා ඡන්ද හිමියන්ගේ ශුභ සාධනය සඳහා ප්‍රජා මධ්‍යස්ථාන හා වෙනත් මධ්‍යස්ථාන පිහිටුවීම.

2—ඒ 100858—7,200 (87/12)

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, ස්වකීය මුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ යොදා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා අස් කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

**5.** (1) සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන භාරකාර මණ්ඩලයක් විසින් ඒ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන සංගමයේ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ සාමාජිකත්වයට බඳවා ගැනීම හා සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, සංස්ථාවේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් විසින් තම කාර්ය ඉටු කිරීම, සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සහ සංස්ථාවේ කටයුතු සාමාන්‍යයෙන් කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල, සංස්ථාවේ මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. ඒ රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව වෙත පවරනු ලැබූ දේපළ.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමය සතුව තිබුණු චංචල සහ නිශ්චල සියළු දේපළ, සංගමයේ නමින් නැතහොත් යම් පුද්ගලයකුගේ හෝ පුද්ගලයන්ගේ නමින් හෝ නම්වලින් භාරයක් වශයෙන් සංගමය විසින් දරනු ලැබ තිබුණ ද ඒවා සංස්ථාව වෙත සතුවිය යුතු අතර ඒවා මෙයින් සංස්ථාපිත සංස්ථාව වෙත මෙයින් සතු කර දෙනු ලැබේ.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක් හෝ අන්තිම කැමති පත්‍රයකින් වූ දේපළ නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයෙන් නියාදනය කිරීමේ බලය සහිතව සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තැබිය යුතු අතර සංස්ථාවේ ප්‍රධාන භාරකරු හෝ ඔහු නොමැති විට ඊළඟට ජ්‍යෙෂ්ඨ භාරකරු ඇතුළු භාරකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් ඉදිරිපිට මුද්‍රාව තැබූ බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් පවතින්, ඔවුන් මඟින් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.